සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

| 29 | S | I |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය ............................ **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I** කාලය පැය දෙකයි

- **අංක 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා නියමිත අංකයේ කතිරයක් (x) යොදන්න.**

01. පුද්ගලයන් දෙදෙනෙකු අතර එක සමාන මනෝවෘත්තියක් ඇති කිරීම සන්නිවේදනය බව ප්‍රකාශ කරන ලද්දේ,
    1. ෂැනොන් හා වීවර්ය.
    2. මහාචාර්ය විල්බර් ශ්‍රාම්ය.
    3. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
    4. ඩේවිඩ් කේ. බර්ලෝය.
    5. ඇරිස්ටෝටල් ය.

02. කල්පනා කිරීම, තනිව හැඬීම, සිහින මැවීම ආදිය අයත් වන්නේ,
    1. ජන සන්නිවේදනයට යි.
    2. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයටයි.
    3. අන්තර් පුද්ගල සන්නිවේදනයටයි.
    4. සමූහ සන්නිවේදනයටයි.
    5. විශ්ව සන්නිවේදනයටයි.

03. වචන භාවිතයෙන් තොරව සිදුවන සන්නිවේදනයේදී,
    1. භාෂාව විධිමත්ව භාවිත කරයි.
    2. කටහඬ භාවිත නොකරයි.
    3. ව්‍යාකරණ හෝ රීතීන් භාවිත කරයි.
    4. සංඥා, සංකේත, ඉඟි භාවිත කරයි.
    5. වාචික සන්නිවේදනයට වඩා අඩු කාර්යක්ෂමතාවකින් සිදුවේ.

04. සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමේ අරමුණු අතරට අයත් නොවන්නේ,
    1. නව අදහස් උත්පාදනය කර ගැනීම.
    2. ගැටළු විසඳා ගැනීම.
    3. සැඟවුණු අදහස් ප්‍රකාශකර ගැනීම.
    4. විසම්මුතියෙන් තොරව එකඟත්වයක් ඇතිකර ගැනීම.
    5. සහානුභූතිය වර්ධනය කර ගැනීම.

05. ප්‍රශස්ත තීරණයක් ගැනීමේදී වඩාත් වැදගත් වන්නේ,
    1. විකල්ප අතරින් තෝරාගත් එකක් වීම.
    2. අන්‍යයන්ගේ මතයට ඉඩක් නොතැබීම.
    3. ඉතා කෙටි කාලයකින් තීරණයකට එළඹීම.
    4. වයසින් මුහුකුරා ගිය අයෙකු වීම.
    5. යහපත් මෙන්ම අයහපත් තොරතුරු ද යොදාගැනීම.

06. ස්ව සංකල්පය පිළිබඳ සාවද්‍ය වන්නේ,
1. පුද්ගලයෙකුගේ කායික ස්වභාවය ස්ව සංකල්පය වර්ධනයට හේතුවිය හැකිය.
2. සමාජය විසින් පුද්ගලයෙකු පිළිගන්නා ආකාරය ඔහුගේ ස්ව සංකල්පය වර්ධනයට හේතු වේ.
3. ස්ව සංකල්පය ඇගයීමට ලක්කළ නොහැකිය.
4. නිරන්තරයෙන් වෙනස් වන්නාවූ ක්‍රියාවලියකි.
5. සමාජ විද්‍යා හා මනෝවිද්‍යා ක්ෂේත්‍ර තුළින් ජනිත වූවකි.

07. කිසියම් පරමාදර්ශී චරිතයක ගති ලක්ෂණ තමන්ට ආරෝපණය කරගැනීම හඳුන්වන්නේ,
1. අනුකරණය ලෙසයි. 2. තදාත්මීකරණය ලෙසයි.
3. භූමිකා නිරූපණය ලෙසයි. 4. සමාජානුයෝජනය ලෙසයි.
5. ප්‍රජානනය ලෙසයි.

08. මානව සංවර්ධනයට හේතු වූ සන්නිවේදනය ඉතිහාසයේ සුවිශේෂී හැරවුම් ලක්ෂය වූයේ,
1. භාෂාවක් භාවිතා කිරීමයි.
2. පණිවිඩ ගෙනයාමේ ක්‍රම භාවිත කිරීමයි.
3. කඩදාසිය සොයා ගැනීමයි.
4. රැහැන් රහිත සන්නිවේදන ක්‍රම සොයා ගැනීමයි.
5. මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමයි.

09. - නව සමාජ හර පද්ධති හා අර්ථ සමාජගත කිරීම.
- පාරිභෝගිකවාදයට එරෙහිවීම.
- සමාජ විඥානය වෙනස් කිරීමට උත්සාහ ගැනීම.
යන ලක්ෂණ දැකගත හැකි වන්නේ,
1 දැනුම් සමාජයේය. 2. පුරවැසි මාධ්‍යයේය.
3. විකල්ප හා විරෝධාකල්ප මාධ්‍යයේය. 4. ජන මාධ්‍යයේය.
5. අභිසාරී මාධ්‍යයේය.

10. සමාජයක බල කේන්ද්‍රණයට අභියෝග එල්ලකළ හැකි සාධකය වන්නේ,
1. සම්පත් හිමිකම 2. අධ්‍යාපනය 3. ප්‍රබලම ආගම
4. ජනමාධ්‍යය 5. කලාව

11. එදිනෙදා සමාජයේ සන්නිවේදනය සඳහා භාවිත කරන්නේ,
1. සිංහල භාෂාවයි. 2. මව් භාෂාවයි. 3. ජීව භාෂාවයි.
4. උප භාෂාවයි. 5. ජාතික භාෂාවයි.

12. නව මාධ්‍යයන් සඳහා භාෂාව භාවිත කිරීමේදී දැකිය හැකි දේශීය ලක්ෂණයක් වන්නේ,
1. ලේඛන සංක්ෂිප්ත වීම.
2. ජාත්‍යන්තර භාෂාවලින් ක්‍රියාත්මක වීම.
3. ඡායාරූප භාවිත කිරීම.
4. ඉංග්‍රීසි අකුරුවලින් දේශීය භාෂා ලිවීම.
5. කථන ව්‍යවහාරය යොදා ගැනීම.

13. දැණුම් සමාජයක් ලෙස හැඳින්විය හැක්කේ,
1. අධ්‍යාපනික වටපිටාවක් සහිත සමාජයකි.
2. තොරතුරු මත පදනම් වූ සමාජයකි.
3. දියුණු සන්නිවේදන තාක්ෂණයක් සහිත සමාජයක්
4. මුදල මත පදනම් වූ සමාජයකි.
5. චින්තනය මත පදනම් වූ සමාජයකි.

14. පුවත්පත්වල භාවිත භාෂාවේ විශේෂත්වය වන්නේ,
   1. කෙටි වාක්‍ය සහිත වීම.
   2. ඉතා ඉක්මනින් ග්‍රහණයවන, සංවේදී වචන හා යෙදුම් සහිතවීම.
   3. ග්‍රාහක පරිකල්පනය ඉහළ නැංවීමට යෝග්‍ය වීම.
   4. රූපය හා භාෂාව එක හා සමානව ප්‍රභල වීම.
   5. අනවශ්‍ය පරිදි සංඛ්‍යා දත්ත භාවිත නොකිරීම.

15. මැතිවරණ ප්‍රචාරණ රැස්වීමක් වාර්තා කිරීමට ගිය ජනමාධ්‍යකරුවන් පිරිසකට පහරදී උපකරණවලටද අලාභ හානි කොට පලවාහරින ලදී. මෙවැනි සිදුවීමක් හොඳින් විග්‍රහවන්නේ,
   1. දෙපියවර සංකල්පයෙනි.
   2. අධිපතිවාදී සංකල්පයෙනි.
   3. නිදහස් මතවාදී සංකල්පයෙනි.
   4. කොමියුනිස්ට්වාදී සංකල්පයෙනි.
   5. විප්ලවවාදී සංකල්පයෙනි.

16. ඕනෑම සමාජයක දක්නට ලැබෙන ප්‍රධාන අංශ දෙක වන්නේ,
   1. ආර්ථික හා ප්‍රජාමූලයි. 2. දේශපාලන හා ආර්ථික මූලයි.
   3. කාර්මික හා ව්‍යවසායමූලයි. 4. ප්‍රජාමූල හා ව්‍යවසාය මූලයි.
   5. සම්පත් හා ආර්ථිකමූලයි.

17. A - පුද්ගලයන් අතර සුහදශීලී වාතාවරණයක් නිර්මාණය කිරීම.
   B - භාෂාව යොදාගනිමින් පෞද්ගලික දෘෂ්ටිය හා මතවාද ඉදිරිපත් කිරීම.
   C - භාෂාවේ සම්ප්‍රදායන්, රීතී, යෙදුම් ව්‍යාකරණ ආදිය අත්‍යවශ්‍ය වීම.
   D - ඉරියව් හා හැසිරීම් රටා භාෂා උච්චාරණය හා මුසුවීම.
   ඉහත ලක්‍ෂණ සහිත භාෂා භාවිත ප්‍රභේද අඩංගු වරණය වන්නේ,

   1. භාෂණය, ලේඛනය, විවරණය, රූපනය
   2. භාෂණය, විවරණය, ලේඛනය, රූපනය
   3. විවරණය, භාෂණය, ලේඛනය, රූපනය.
   4. විවරණය, ලේඛනය, රූපනය, භාෂණය
   5. කථනය, විවරණය, භාෂණය, රූපනය

18. ශ්‍රාම් - ඔස්ගුඩ් ආකෘතිය හා බැඳුණු නිවැරදි පිළිතුර වන්නේ,
   1. බලපෑම පිළිබඳව වැඩි අවධානයක් යොමුකරයි.
   2. සෝෂණය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
   3. ජීව විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක විග්‍රහයක යෙදේ.
   4. සන්නිවේදනයේ ද්විමාර්ගික ස්වභාවය පැහැදිලි කරයි.
   5. පංචේන්ද්‍රියන් ඇසුරෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පැහැදිලි කරයි.

19. ප්‍රාථමික සන්නිවේදන ක්‍රමයක් නොවන්නේ,
   1. අභිනය 2. රංගනය 3. ලේඛනය
   4. චිත්‍ර සටහන් 5. ගිනිමැලය

20. නුවන් තමන් සේවය කරන මාධ්‍ය ආයතනයට ලබාදුන් ප්‍රවෘත්තිය සංශෝධනයට ලක්කිරීමට සංස්කාරකවරයා කටයුතු කළේය. මෙම තත්ත්වය
   1. දෙපියවර සංකලපයයි. 2. නිදහස් මතවාදී සංකලපයයි.
   3. දොරටුපාලක සංකල්පයයි. 4. සමාජ වගකීම් සංකල්පයයි.
   5. අධිපතිවාදී සංකලපයයි.

21. 'වගවීම' යනුවෙන් හඳුන්වන්නේ,
    1. සමූහය තුළ අරමුණු ඉටුකර ගැනීමට සහජීවනයෙන් කටයුතු කිරීමයි.
    2. පැවරුණු වැඩකොටස් ඉටුකිරීමයි.
    3. එකඟත්වයෙන් තීරණවලට එළඹීමයි.
    4. නොපැවරුණ වැඩ කොටස් සිය කැමැත්තෙන් ඉටුකිරීමයි.
    5. නායකත්වයට ගරු කරමින් කටයුතු කිරීමයි.

22. පෙර සූදානමකින් තොරව පන්තිකාමරයේ දී භාවිත කළහැකි ප්‍රක්ෂේපණීය උපකරණය වන්නේ,
    1. බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
    2. ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
    3. ඕවර්හෙඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රයි.
    4. ස්ලයිඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
    5. සිනමා ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.

23. පාසල් නොයා පෞද්ගලික පන්ති සඳහා සහභාගිවීම පිළිබඳව නායනා, සුමුදු සහ කමනී අතර පැවතියේ මත දෙකකි. දීර්ඝ කතාබහකින් පසුව කරුණු අවබෝධකරගත් ඔවුහු එකම මතයකට එළඹුනහ. මෙයින් ගම්‍ය වන්නේ,
    1. සහෝදරත්වයේ වටිනාකමයි.
    2. තාර්කික චින්තනය හා තීරණ ගැනීමයි.
    3. විසම්මුතිය හා ඒකාග්‍රතාවයයි.
    4. අන්තර් පුද්ගල සන්නිවේදනයයි.
    5. විසම්මුතියේ වැදගත්කමයි.

24. සමන් සිය ජංගම දුරකථනයෙන් ලබාගත් නීතිවිරෝධී ව්‍යාපාරයක නිරතවන පුද්ගලයින් පිරිසක් පිළිබඳ වීඩියෝ පටයක් රූපවාහිනී මාධ්‍ය ආයතනයකට ලබා දී රටටම අනාවරණය කිරීමෙන් අනතුරුව ඔවුන් නීතියේ රැහැනට හසුකර දීමට හැකි විය. මෙම තත්ත්වය,
    1. විකල්ප ජනමාධ්‍ය ක්‍රියාත්මක වීමකි.
    2. පුරවැසි මාධ්‍යවේදය ක්‍රියාත්මක වීමකි.
    3. නව මාධ්‍ය භාවිතයකි.
    4. නූතන මාධ්‍ය භාවිතයකි.
    5. විධිමත් සන්නිවේදනයේ භාවිතයකි.

25. ජන සන්නිවේදනයේ ලක්ෂණයක් නොවන්නේ,
    1. ආයතනගතව හා සංවිධානාත්මකව සිදුවීම.
    2. සන්නිවේදන ක්‍රියාවලිය ඒකමාර්ගිකව සිදුවීම.
    3. සන්නිවේදකයා දන්නා නිශ්චිත ග්‍රාහක පිරිසකට සන්දේශ ලබාදීම.
    4. පුහුණු මාධ්‍යකරුවන් අවශ්‍ය වීම.
    5. උසස් තාක්ෂණික ක්‍රියාවලියක් අත්‍යවශ්‍ය වීම.

26. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
    1. විධිමත් සන්නිවේදනයට වඩා අවිධිමත් සන්නිවේදනය වේගවත් ය.
    2. 'පාර භාෂාව' අවාචික සන්නිවේදනයේ අංගයකි.
    3. අවමංගල අවස්ථාවකදී සුදු කොඩි දැමීම දෘශ්‍ය සන්නිවේදන අවස්ථාවකි.
    4. වාචික සන්නිවේදනයට වඩා අවාචික සංඥා කාර්යක්ෂම ය.
    5. වාචික සන්නිවේදනයේදී වචන 55% ක් භාවිතා කරයි.

27. වචන භාවිතයෙන් තොරව නිර්මාණයක් ඉදිරිපත්කළ හැකි ක්‍රමයකි,
    1. සිනමාව    2. වේදිකා නාට්‍ය    3. රූපවාහිනී නාට්‍ය
    4. අභිරූපන    5. ගුවන්විදුලි නාට්‍ය

28. රුවන් පාසලේ ජනප්‍රිය ශිෂ්‍යයෙකි. ඔහු තම මිතුරන්ගේ දුක සැප නිතර සොයා බලයි. අන්‍යයන්ගේ විපතකදී ඉතාමත් සංවේදීවන ඔහු එය තමන්ට සිදුවූ දෙයක් සේ සලකා උපකාර කිරීමට පෙළඹෙයි. රුවන්ගේ චරිතය තුළින් ප්‍රකටවන ලක්ෂණය වන්නේ,
1. ආචාරශීලීත්වය 2. සහවේදනයයි 3. ස්ව සංකල්ප පෝෂණයයි.
4. සමාජානුයෝජනයයි 5. ඵලදායී කථනයයි.

29. ඥාන ගවේෂණයේ කාර්යයක් නොවන්නේ,
1. සංජානනයයි. 2. නියෝජනයයි. 3. සංකල්ප විනිශ්චයයි.
4. නියාමනයයි. 5. නිරීක්ෂණයයි.

30. මතකය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. ඉන් අසත්‍ය වන්නේ,
1. තමන් කළ කී දෙයින් මතකය වඩාත් ඉහළ නැංවේ.
2. කියවීම හා අසා සිටීම ඉතා පහළ මතක අගයක් පෙන්වයි.
3. මතකය ඉහළ නැංවීමට ඇති එකම ක්‍රමය පුණරීක්ෂණයයි.
4. මතකයේ ඇති දේ මතක්කර ගැනීමේ හැකියාව එක් දිනක් ඇතුළත 25% හෝ ඊට වඩා අඩුවේ.
5. පරිසරයෙන් ලබාගන්නා තොරතුරු මුලින්ම කෙටිකාලීන මතකයට ඇතුළත් වේ.

31. ශ්‍රවණ ක්‍රියාවලියෙහි අවස්ථා පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
1. ඇසීම, ඇගයීම, තේරුම්ගැනීම, ප්‍රතික්‍රියා දැක්වීම.
2. ඇසීම, සවන්දීම, ඇගයීම, ප්‍රතික්‍රියා දැක්වීම.
3. ඇසීම, තේරුම්ගැනීම, ඇගයීම, ප්‍රතික්‍රියා දැක්වීම.
4. කථාකිරීම, ඇසීම, තේරුම්ගැනීම, ප්‍රතික්‍රියා දැක්වීම.
5. සංජානනය, ඇසීම, තේරුම්ගැනීම. ප්‍රතික්‍රියා දැක්වීම.

32. සුපුන් තම මිතුරකු වූ නලින් සමඟ අන්තර්ජාලය හරහා කෙටි පණිවිඩ හුවමාරු කරමින් සිටියි. මෙම අවස්ථාවට අදාළ සන්නිවේදනය වර්ගය වන්නේ,
1. අන්තර් පුද්ගල සන්නිවේදනයයි.
2. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි.
3. ජන සන්නිවේදනයයි.
4. විද්‍යුත් සන්නිවේදනයයි.
5. ලිඛිත සන්නිවේදනයයි.

33. සන්නිවේදන නියාමනයේ පරමාර්ථය වන්නේ,
1. සන්නිවේදනයේ වාණිජ පරමාර්ත ඉටුකර ගැනීමයි.
2. සන්නිවේදනයේ යටි අරමුණු ඉටුකර ගැනීමයි.
3. සන්නිවේදනයේ සමාජ පරමාර්ථ ඉටුකරගැනීමයි.
4. සන්නිවේදනයේ දිගුකාලීන අරමුණු ඉටුකර ගැනීමයි.
5. සන්නිවේදනයේ සංවර්ධනයක් ඇති කිරීමයි.

34. පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය වන්නේ,
1. භාෂණය අන්‍යෝන්‍ය තොරතුරු අදහස් හුවමාරු වේ.
2. භාෂණය තුළ දෙපාර්ශ්වයක් දැකිය හැකි වේ.
3. රූපණය දෘශ්‍ය පථය අහිමි මාධ්‍යයන්හි භාවිතකළ නොහැක.
4. කථනය තුළ දෙපාර්ශ්වයටම කථන අවස්ථා විවිර නොවේ.
5. ගුවන් විදුලියේ බහුලව භාෂණයත් කථනයත් අවස්ථානුකූලව භාවිත වේ.

35. අරමුණු සහිතව ප්‍රජානන මුල්කරගෙන ඉගෙනීමක් සිදුවන බව පෙන්වා දුන් න්‍යාය වන්නේ,
1. උත්තේජන ප්‍රතිචාර න්‍යායයි. 2. ක්ෂේත්‍ර ප්‍රජානන න්‍යායයි.
3. ක්‍රියාකාරී ආරෝපණ න්‍යායයි. 4. ප්‍රබෝධක ප්‍රතිචාර න්‍යායයි.
5. මැජික් බුලම් න්‍යායයි.

36. තාරක අන්තර්ජාලය ඇසුරින් තොරතුරු ලබා ගනිමින් පාසල් බිත්තිපුවත්පත සඳහා ලිපියක් සකස් කරයි. මෙම අවස්ථාව හැඳින්විය හැක්කේ,

1. ආකේතීකරය ලෙසය.
2. ආකේතීකරණය ලෙසයි.
3. විකේතීකරණය ලෙසයි.
4. ප්‍රතිපෝෂණය ලෙසයි.
5. විකේතීකරය ලෙසයි.

37. සමාජයේ උපරි ව්‍යුහය නියෝජනය වන්නේ,

1. රාජ්‍ය, ආගම් හා දේශපාලනයයි.
2. ජනමාධ්‍ය, ආර්ථිකය හා අධ්‍යාපනයයි.
3. අධ්‍යාපනය, ප්‍රජාමූල හා ආගමයි.
4. බල කණ්ඩායම්, සාමූහිකත්වය හා නිෂ්පාදන බලවේගයි.
5. කලාව, ආර්ථිකය හා දේශපාලනයයි.

38. ජනමාධ්‍යයයේ භාෂාව භාවිතයේ ප්‍රබලතාවක් නොවන්නේ,

1. සංක්ෂිප්තව හා නිර්මාණශීලීව භාෂාව යොදාගත හැකිවීම.
2. සිත්ගන්නා සුළු ලෙස භාෂාව යොදාගත හැකිවීම.
3. ග්‍රාහකයාගේ සංවේදීතාව ඉහළ නැංවිය හැකිවීම.
4. ග්‍රාහක අවධානය ලබාගත හැකිවීම.
5. සදාචාරාත්මක සීමා නොමැතිවීම.

39. A - ශ්‍රව්‍ය, දෘශ්‍ය, චලන හා වර්ණ මාධ්‍යයක් වීම.
B - ග්‍රාහක පරිකල්පනය පුබුදු කරන මාධ්‍යයක් වීම.
C - දෘශ්‍ය මාධ්‍ය සමඟ භාෂාව එක්වී තිබීම.
D - ලේඛනය භාවිත නොකිරීම.
ඉහත ලක්ෂණ අතුරින් රූපවාහිනී මාධයය සඳහා භාෂාව භාවිතයේ ලක්ෂණ වන්නේ,

1. A හා B ය.
2. B හා C ය.
3. A හා C ය.
4. A, C හා D ය.
5. A, B, C, D යන සියල්ලමය.

40. සෝෂණය කෙරෙහි අවධානය යොමු කළ ද, ප්‍රතිපෝෂණය කෙරෙහි අවධානය යොමුකර නැති සන්නිවේදන ආකෘතිය වන්නේ,

1. ශ්‍රාම් - ඔස්ගුඞ් ආකෘතියයි.
2. හැරල්ඞ් ඩී. ලැස්වෙල් ආකෘතියයි.
3. බර්ලෝ ආකෘතියයි.
4. ෂැනොන් - වීවර් ආකෘතියයි.
5. ඇරිස්ටෝටල්ගේ ආකෘතියයි.

41. වර්තමානයේ නූතන මාධ්‍ය හා නව මාධ්‍ය අතර අන්තර් සබඳතා වර්ධනය වීමටත්, නව සංස්කෘතික ස්වරූප දක්නට ලැබීමටත් හේතුව වන්නේ,

1. දැනුම් සමාජයයි.
2. ගෝලීයකරණයයි.
3. පුරවැසි මාධ්‍යයේ වර්ධනයයි.
4. මාධ්‍ය සංස්කෘතියේ පැතිරීමයි.
5. නව ලිබරල්වාදයයි.

42. විශ්ව විද්‍යාල සිසුන්ගේ උද්සෝෂණයකට එල්ලවූ ප්‍රහාරයක් පිළිබඳ පුවත රූපවාහිනී පුවත් ඔස්සේ නැරඹූ රුවිනි, විශ්ව විද්‍යාලයේ සිටින තම සොහොයුරාට වහාම දුරකථන ඇමතුමක් ලබාගතයුතු යැයි සිතා දුරකථනය අසළට දිව ගියාය.
මෙම සිදුවීමට අදාළ සන්නිවේදන වර්ග වනුයේ,

1. ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනය හා අන්තර්පුද්ගල සන්නිවේදනයයි.
2. ජන සන්නිවේදනය හා අන්තර්පුද්ගල සන්නිවේදනයයි.
3. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය හා අන්තර්පුද්ගල සන්නිවේදනයයි.
4. ජන සන්නිවේදනය හා අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි.
5. දෘශ්‍ය සන්නිවේදනය හා අවාචික සන්නිවේදනයයි.

43. පුද්ගලයෙක් ශ්‍රවණ නිපුණතා වර්ධනය කරගතයුතු වන්නේ,
1. අවබෝධය සඳහා
2. නිවැරදි බව සඳහා
3. ශ්‍රවණ බාධා මගහැරීම සඳහා
4. මතක්කරගැනීමේ අවශ්‍යතාව සඳහා
5. අන් අයගේ තොරතුරු ලබාගැනීම සඳහා

44. පුද්ගලයෙකු තම හැකියාවන්, නිපුණතාවන්, පෙනුම හා සමාජ පිළිගැනුම පිළිබඳ දරණු ලබන ආකල්ප හැඟීම් හා දැනුම ස්ව සංකල්පය ලෙස අර්ථ දක්වන ලද්දේ,
1. රෝජර්ස් ය.
2. බර්න් ය.
3. පර්කි ය.
4. බාර්ලෝ ය.
5. ක්ලෝඩ් ය.

45. කිසිවකු විසින් 'භාෂාවක් ග්‍රහණය කර ගැනීම හා භාෂාව පරිහරණයට ඉගෙන ගැනීම' හඳුන්වනු ලබන්නේ,
1. භාෂාවේ අර්ථවේදය ලෙසයි.
2. භාෂාවේ සංඥාර්ථවේදය ලෙසයි.
3. භාෂා සංජානනය ලෙසයි.
4. භාෂා උපාර්ජනය ලෙසයි.
5. ජීව භාෂා ප්‍රවණතා ලෙසයි.

46. පහත ප්‍රකාශ අතරින් නිරවද්‍ය වන්නේ,
1. භාෂාවේ අසම්මතයට අනන්‍ය ලක්ෂණ තිබේ.
2. අජීවී භාෂා බවට පත්වූ භාෂාවන් යළි ජීව භාෂා බවට පත් නොවේ.
3. උප භාෂාවන් රටක ප්‍රධාන ජනමාධ්‍ය සඳහා භාවිත නොවේ.
4. අසම්මත භාෂාව යනු භාෂාවක වැඩීමකි.
5. භාෂාවක් පෝෂණය වීමේ දී සංජානනය පිළිබඳ විවිධතා ඇති නොවේ.

47. සමාජයක 'පන්ති' නිර්මාණය වන්නේ,
1. අධ්‍යාපනය හේතුකොට ගෙනයි.
2. ජනමාධ්‍යයේ බලපෑම මතයි.
3. ආර්ථික හා නිෂ්පාදන බලවේග අනුවයි.
4. රාජ්‍යය හා ආගම් අනුවයි.
5. සම්පත් හිමිකම හේතුකොට ගෙනයි.

48. ගෝලීයකරණයේ නව ප්‍රවණතාවක් නොවන්නේ,
1. ජනසන්නිවේදන මාධ්‍යයන්ගේ ගුණාත්මක වර්ධනයක් සිදුවීම.
2. ආත්ම කේන්ද්‍රීය මාධ්‍ය බිහිවීම.
3. බහුජන තොරතුරු අවකාශය වාණිජකරණය වීම.
4. නව සංස්කෘතික ස්වරූප ඇතිවීම.
5. විචිත්‍ර සංස්කෘතියක් බිහිවීම.

49. ඵලදායී කථනයක් තුළ නොතිබිය යුතු ගුණාංගය වන්නේ,
1. අරමුණක් සහිතවීම.
2. අදහස් සංවිධානය කර තිබීම.
3. ඉවසීම හා සංයමය සහිත වීම.
4. ධනාත්මක අදහස්වලින් තොරවීම.
5. ආවේගශීලී නොවීම.

50. ශාරීරික භාෂාව අයත්වන්නේ,
1. නිර්වාචික සන්නිවේදනයට යි.
2. අවිධිමත් සන්නිවේදනයටයි.
3. වාචික සන්නිවේදනයටයි.
4. විධිමත් සන්නිවේදනයටයි.
5. ජන සන්නිවේදනයටයි.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

29 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Second Term Test - Grade 12 - 2018

විභාග අංකය ..............................

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

කාලය පැය තුනයි

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) සන්නිවේදනය යනු කුමක්දැයි ලැස්වෙල් නිර්වචනය ආශ්‍රයෙන් හඳුන්වන්න. (ල. 2)

(ii) අ) සංවර්ධන සන්නිවේදන සංකල්පය මගින් ප්‍රකාශයට පත් කෙරෙන අරමුණ කුමක්ද?

ආ) විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් විසින් නිදහස් අධ්‍යාපනය කප්පාදුවට එරෙහිව නගන හඬ මර්ධනය කිරීමට රජය ගන්නා ප්‍රචණ්ඩකාරී පියවර කවර සන්නිවේදන සංකල්පයක ලක්ෂණයක්ද? එම සංකල්පය ක්‍රියාවට නැගෙන අවස්ථාවකට වෙනත් උදාහරණයක්ද දෙන්න. (ල. 4)

(iii) විකල්ප සහ විරෝධාකල්ප මාධ්‍යයේ විශේෂ ලක්‍ෂණ තුනක් විස්තර කරන්න. (ල. 6)

(iv) ජන සන්නිවේදනයේ ස්වභාවය එහි ලක්ෂණ හතරක් ආශ්‍රයෙන් විස්තර කරන්න. (ල. 8)

02. (i) සන්නිවේදනය මගින් ඉටුකරගැනීමට බලාපොරොත්තු වන අරමුණු 4ක් දක්වන්න. (ල. 2)

(ii) සමාජයක ඇති වටිනාම සම්පත 'මිනිසා' ලෙස පිළිගත හැකිද? නොහැකිද? හේතු 2ක් දක්වා විස්තර කරන්න. (ල. 4)

(iii) සන්නිවේදන කාර්යයේදී මිනිසා සතු ශක්තිය සීමාවකට ලඟාවේ. එම සීමාව ජය ගැනීමට මිනිසා යොදාගෙන ඇති ක්‍රම තුනක් විස්තර කරන්න. (ල. 6)

(iv) ගෝලීයකරණය සංකල්පයේ ස්වභාවය කරුණු හතරකින් පැහැදිලි කරන්න. (ල. 8)

03. (i) 'දැනුම් සමාජයක්' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 2)

(ii) සමූහ සන්නිවේදනයේ විවිධ කණ්ඩායම් ස්වරූප නම් කරන්න. එයින් විධිමත් සන්නිවේදන කණ්ඩායම් දෙකක් කෙටියෙන් හඳුන්වන්න. (ල. 4)

(iii) ගුවන්විදුලි මාධ්‍ය සඳහා භාෂාව භාවිතා කිරීමේදී අනුගමනය කළයුතු විශේෂ කරුණු 3ක් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) ස්ව සංකල්පය ක්‍රියාත්මක වන අතුරු අංශ දක්වා, ස්ව සංකල්පය වර්ධනය කරගත හැක්කේ කෙසේදැයි විස්තර කරන්න. (ල. 8)

04. (i) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ගුණාත්මක බව ඉහළ නැංවිය හැක්කේ පුද්ගලයෙකු සතු කුමන කුසලතාවයක් පදනම් කරගෙනද යන්න පැහැදිලි කරන්න. (ල. 2)

(ii) සමූහ සන්නිවේදන ක්‍රියාවලියකදී ආචාරශීලීත්වය පවත්වා ගැනීම වැදගත් වන්නේ කුමක් සඳහාදැයි කරුණු දෙකකින් විස්තර කරන්න. (ල. 4)

(iii) ශ්‍රව්‍ය සන්නිවේදනය යන්න හඳුන්වා, ශ්‍රවණයේ අවස්ථා දක්වා, විධිමත් සන්නිවේදනයට අයත් තාක්ෂණික ශ්‍රව්‍ය මාධ්‍ය දෙකක් නම් කරන්න. (ල. 6)

(iv) සමාජයක අන්තර් සබඳතා දියුණුවීමට 'සන්නිවේදන සංවර්ධනය' ඉවහල් වන්නේ කෙසේද? විස්තර කරන්න. (ල. 8)

05. (i) ගෝලීයකරණ ප්‍රවණතා 4ක් සඳහන් කරන්න. (ල. 2)

(ii) ද්වි මාර්ගික සන්නිවේදන ආකෘතියක් ඇඳ නම් කර පැහැදිලි කරන්න. (ල. 4)

(iii) අවිධිමත් සන්නිවේදන දාම දක්වන්න. එයින් සන්නිවේදනය සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ල. 6)

(iv) සන්නිවේදනයේ සාමාජීය භූමිකාවක් වන සමාජානුයෝජනය පිළිබඳ විස්තර කරන්න.

1. සමාජානුයෝජනය හැඳින්වීම. (ල. 2)
2. සමාජානුයෝජනය තුළින් වර්ධනය කරගන්නා හැසිරීම් රටා දැක්වීම. (ල. 2)
3. සමාජානුයෝජනය වන ප්‍රධාන ක්‍රම යනාදිය ඇතුළත් කර පැහැදිලි කිරීම. (ල. 8)

06. (i) ඥාන ගවේෂණයේ කාර්යයන් 4ක් නම් කරන්න. (ල. 2)

(ii) 'සන්නිවේදනයේ ගෝලීයකරණය' යන්න පැහැදිළි කරන්න. (ල. 4)

(iii) පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රසිද්ධම මාධ්‍ය උපකරණය නම් කරන්න. එය පරිහරණයේදී සැළකිලිමත් විය යුතු කරුණු 3ක් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) භාෂාවේ දෘශ්‍ය ස්වරූපය ලෙස දක්වෙන්නේ කුමන සන්නිවේදන ස්වරූපයක්ද? එම ස්වරූපය කරුණු 04 කින් විස්තර කරන්න. (ල. 8)

07. (i) අන්තර්පුද්ගල සම්බන්ධතාවය සාර්ථකව පවත්වා ගැනීමට පුද්ගලයන්ට භාවිතයට ගතහැකි නිපුණතා නම් කරන්න. (ල. 2)

(ii) සමූහයක් ලෙස කටයුතු කරන විට යම් යම් කරුණු සම්බන්ධයෙන් විසම්මුතියකට පත්වීම හෝ එකඟත්වයකට පත්වීම සාමාන්‍ය ස්වභාවයකි. මෙම අදහස පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ල.4)

(iii) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය ප්‍රධාන කරුණු 3ක් ආශ්‍රයෙන් විස්තර කරන්න. (ල. 6)

(iv) සාමාන්‍ය පුද්ගලයෙකුගේ මතකයේ ස්වභාවය මනෝවිද්‍යානුකූලව ප්‍රතිශතාත්මකව දක්වා විශ්ලේෂණය කරන්න. (ල. 8)

**දෙවන වාර පරීක්ෂණය - 2018 - 12 ශ්‍රේණිය - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**

# I කොටස

## පිළිතුරු පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 2 | **11.** - 3 | **21.** - 4 | **31.** - 3 | **41.** - 2 |
| **02.** - 2 | **12.** - 4 | **22.** - 2 | **32.** - 1 | **42.** - 4 |
| **03.** - 4 | **13.** - 2 | **23.** - 3 | **33.** - 3 | **43.** - 5 |
| **04.** - 5 | **14.** - 2 | **24.** - 2 | **34.** - 3 | **44.** - 2 |
| **05.** - 1 | **15.** - 2 | **25.** - 3 | **35.** - 2 | **45.** - 4 |
| **06.** - 3 | **16.** - 4 | **26.** - 5 | **36.** - 2 | **46.** - 3 |
| **07.** - 1 | **17.** - 2 | **27.** - 4 | **37.** - 1 | **47.** - 5 |
| **08.** - 5 | **18.** - 4 | **28.** - 2 | **38.** - 5 | **48.** - 1 |
| **09.** - 3 | **19.** - 3 | **29.** - 5 | **39.** - 3 | **49.** - 4 |
| **10.** - 4 | **20.** - 4 | **30.** - 3 | **40.** - 4 | **50.** - 1 |

# II කොටස පිළිතුරු

01. (i) සන්නිවේදනය යනු කිසිවෙකු කිසියම් පණිවිඩයක් මාධ්‍යයක් උපයෝගී කරගෙන බලපෑමක් සඳහා ග්‍රාහකයෙකුට ලබාදෙන දෙයයි. (ල. 2)

(ii) අ). ජාතික සංවර්ධනය අරමුණු කරගෙන සන්නිවේදන හා මාධ්‍ය හැසිරවිය යුතු බව (ල. 2)
ආ). අධිපතිවාදී සන්නිවේදන සංකල්පය උදා : ගැළපෙන ඕනෑම උදාහරණයකට ලකුණු දෙන්න. (2)

(iii) 1. ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍යට පරිබාහිරව ක්‍රියාත්මකවන ජනමාධ්‍යවේදී ශෛලියක් වීම.
2. සම්ප්‍රදායික සහ බලවත් මධ්‍ය ආයතනවලට එරෙහිව ගොඩ නැගීම.
3. ලාභ ප්‍රයෝජන සඳහා නොව මතවාදී කාර්යයන් පවත්වාගෙනයාමට ක්‍රියාත්මක වීම.
4. නව සමාජ හර පද්ධති සමාජගත කිරීමේ අරමුණක් පැවතීම. (3ක් විස්තර කිරීමට ලකුණු 6)

(iv) විශාල ජනස්කන්ධයක් සමඟ ජනමාධ්‍ය භාවිතයෙන් සිදුවන්නේ ජන සන්නිවේදනයයි.
1. සෑම විටම ආයතනගතව සංවිධානාත්මකව සිදුවේ.
2. භාෂා සාක්ෂරතාව, ශ්‍රවණ සාක්ෂරතාව, ශ්‍රව්‍ය දෘශ්‍ය සාක්ෂරතාව යන සාක්ෂරතාවයන් ජන සන්නිවේදනය ග්‍රහණය කරගැනීමට අවශ්‍ය වේ.
3. ජන සන්නිවේදනය ලබාදෙන්නේ වෘත්තිකයන් පිරිසක් විසින්.
4. පූර්ණ ලෙසම තාක්ෂණය ජන සන්නිවේදනය සඳහා භාවිතා වේ. (විස්තර කර තිබිය යුතුය ලකුණු 8.)

02. (i) 1. තොරතුරු ලබා ගැනීම, ලබාදීම. 2. අධ්‍යාපනික කාර්ය
3. සමාජානුයෝජන ක්‍රියාවලිය. 4. විනෝදාස්වාදය (ල. 2)

(ii) පිළිගත හැකිය. හැකි / නොහැකි බව දක්වා තිබීම අනිවාර්ය වේ. (ල. 1)
1. මිනිසුන් විසින් වටිනා සම්පත් ලෙස සලකන විවිධාකාර ධනයන් නිර්මාණය කරන්නේත්, සොයාගන්නෙත් මිනිසා විසින්ම වීම.
2. මිනිසා විසින් බුද්ධිමය සම්පත් නිර්මාණය කිරීම.
3. මිනිසා නව භෞතික සම්පත් නිර්මාණය කිරීම. කරුණු 2 විස්තර කිරීමට (1 x 1/2x 2 = 3) 1+3 = 4

(iii) බාහිර උපකරණ භාවිතා කිරීම.
1. කටහඬ සීමාව සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර, දුරකථන
2. සන්නිවේදන ස්ථානයේ නොමැතිදේ පෙන්වීමට - ඡායාරූප, වීඩියෝ.
3. විශාලකර පෙන්වීමට - ප්‍රොජෙක්ටර් නව මාධ්‍ය (ල. 6)

(iv) 1. ගෝලීයකරණ සංකල්පය හා බැඳුණු පොදු න්‍යායක් නොමැතිකම.
2. මෙම සංකල්පය විවිධ මානවලින් සියලු විෂය පරාසයන් පුරා පැතිරී පැවතීම.
3 මානව සමාජ පරිණාමයේ නව අවධියක් සනිටුහන් කරන, නවකුලකයක් සහ නව ව්‍යුහයක් ලෙස දැක්විය හැකිවීම.
4. ඒකීය සමස්තයක් ලෙස මානව සමාජය ඒකාබද්ධ කිරීම ගෝලීයකරණයෙන් සිදුවීම.
(පැහැදිලි කර තිබිය යුතුය ල. 08)

03. (i) 1970 - 1980 අතර කාලයේ බටහිර අනාගතවාදී සංකල්පය තුළ තොරතුරු මත පදනම්ව බිහිවූ සමාජයකි. (ල. 2)

(ii) 1. අහඹු කණ්ඩායම් 2. විශෝධන කණ්ඩායම් 3. ඉගෙනුම් කණ්ඩායම්
4. ප්‍රතිපත්ති සැකසුම් කණ්ඩායම් 5. ක්‍රියාකාරී කණ්ඩායම්
* සමහර අවස්ථාවල විශෝධන කණ්ඩායම් සහ ක්‍රියාකාරී කණ්ඩායම් විධිමත් හෝ අවිධිමත් විය හැක.
* අහඹු කණ්ඩායම් විධිමත් නොවේ.
* ඉගෙනුම් කණ්ඩායම් සහ ප්‍රතිපත්ති සැකසුම් කණ්ඩායම් පිළිබඳ හැඳින්වීමක් කර තිබිය යුතුය. (ල.4)

(iii) 1. පරිකල්පනය සඳහා භාෂාව යොදාගතයුතුවීම.
2. කෙටි වාක්‍ය වැඩි වශයෙන් යොදාගත යුතු වීම.
3. ගුවන් විදුලි වැඩ සටහනේ ස්වභාවය අනුව භාෂාව යොදා ගැනීම.
4. සරල භාෂාවක් භාවිතා කළයුතුවීම.
5. අනවශ්‍ය ලෙස සංඛ්‍යාදත්ත ඉදිරිපත් නොකිරීම. (ල. 6)
(පැහැදිලි කර තිබිය යුතුය ල. 06)

(iv) 1. කායික ස්වභාවය සම්බන්ධ ස්ව සංකල්පය. 2. හැකියාවන් පිළිබඳ ස්ව සංකල්පය
3. සමාජ පිළිගැනුම් පිළිබඳ ස්ව සංකල්පය
මෙම අංශ තුන වර්ධනය කරගැනීමෙන් ස්ව සංකල්පය වර්ධනය කරගත හැකි ආකාරයට විස්තර කිරීමට(ල. 8)

04. (i) චිත්ත වේගයන් පාලනය කරගැනීමට පුද්ගලයෙකු සතු කුසලතාවය පදනම් කර ගැනීම පිළිබඳව පැහැදිලි කර තිබිය යුතුය. (ල. 2)

(ii) 1. සමූහය තුළ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට විස්තර කර තිබිය යුතුය.
2. සමූහයේ පැවැත්ම බිඳ නොවැටීමට. 3. සමූහයේ සංවරබව වැඩිදියුණු වීමට.
4. සමූහය තුළ ප්‍රසන්න වාතාවරණයක් නිර්මාණය කිරීමට. (ල. 4)

(iii) ශ්‍රව්‍ය සන්නිවේදනය යනු ශ්‍රවණය තුළින් සිදු කෙරෙන සන්නිවේදනයයි. පැහැදිලි කිරීම. (ල. 2) ශ්‍රවණයේ අවස්ථා : ඇසීම, තේරුම් ගැනීම, ඇගයීම, ප්‍රතික්‍රියා දැක්වීම. (ල. 2)
තාක්ෂණික ශ්‍රව්‍ය මාධ්‍ය - ගුවන් විදුලිය, සංයුක්ත තැටි, දුරකථනය, ශබ්ද විකාශන උපකරණ. (ල.2) (ල. 6)

(iv) සන්නිවේදනය සමාජය පවත්වාගෙන යන ප්‍රධාන මෙහෙයුම් කාරකයයි. සන්නිවේදනය ජන සන්නිවේදනය දක්වා විකාශනය වීම. (පුවත්පත, ගුවන්විදුලිය, රූපවාහිනිය බිහිවීම) විශ්ව සන්නිවේදනය දක්වා සංවර්ධනය වීම, නව මාධ්‍ය බිහිවීම, විද්‍යුත් තාක්ෂණික සන්නිවේදන මෙවලම් බිහිකර ගැනීම මෙම සංවර්ධනය නිසා සන්නිවේදනය සමාජය අන්තර් සබඳතා දියුණුවීමට බලපාන ආකාරය විස්තර කර තිබිය යුතුය. (ල. 8)

05. (i) 1. ගෝලීයකරණය සමඟ කලාපීයකරණය සිදුවීම.
2. ද්‍රව්‍යමය ආර්ථිකය අභිබවා මූල්‍ය ආර්ථිකය ශක්තිමත් වීම.
3. විද්‍යාව සහ තාක්ෂණය ආර්ථිකයේ තීරණාත්මක බලවේග වීම.
4. ජන සන්නිවේදන මාධ්‍යයන්ගේ ප්‍රමාණාත්මක වර්ධනයක් සිදුවීම. (ල. 2)

(ii) ශ්‍රාම් - ඔස්ගුඩ් ආකෘතිය ඇඳ නම්කර පැහැදිලි කිරීමට. (ල. 4)

(iii) අවිධිමත් ධාරාවන් ඔස්සේ අපිළිවෙලට ගලා යන්නේ අවිධිමත් සන්නිවේදනයයි.
තනිදාමය - එක් අයෙකුගෙන් ඊළඟ තැනැත්තාට තොරතුරු ගමන් කිරීම.
සම්භාවිතාදාමය - හමුවූ අයට තොරතුරු ලබාදීම.
පර්ෂද දාමය - නිශ්චිත සබඳතාවයක් ඇති කිහිප දෙනෙකුට තොරතුරු ලබාදීම. ඔවුන්ද ඒ ආකාරයට සන්නිවේදනය සිදුකිරීම
ඕපාදූප දාමය - එක් අයෙකු අනෙක් සියල්ලන්ට සන්නිවේදනය කරයි. (ල. 6)

(iv) 1. සමාජ ජීවිතයේ විවිධ අවස්ථාවලදී හැසිරිය යුතු ආකාරය ඉගෙන ගැනීම සමාජානුයෝජනයයි.
2. 1. පුද්ගලයාගේ අවශ්‍යතා සම්පූර්ණ කරන හැසිරීම්.
2. පුද්ගලයා අයත්වන සමාජය විසින් යහපත්යයි සම්මත හැසිරීම්.
3. 1. අනුකරණය 2. තදාත්මීකරණය 3. භූමිකා නිරූපණය
ඉහත සඳහන් කරුණු විස්තර කර තිබිය යුතුය (ල. 8)

06. (i) 1. සන්නිවේදනය 2. සංජානනය 3. නියෝජනය 4. සංකල්ප 5. විනිශ්චය හා නියාමනය (ල. 2)

(ii) ලෝකය පුරාම පාරජාතික පරිමාණයෙන් විඥාපන අමුද්‍රව්‍ය, තොරතුරු සබඳතා සහ මාධ්‍යයන් පද්ධති වශයෙන් ව්‍යාප්තවීම. (ල. 4)

(iii) කළු ලැල්ල - කරුණු තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) ලිඛිත සන්නිවේදනය. (ල. 2)
1. දෘශ්‍ය සංකේත සමූහයක් (අක්ෂර මාලාවක්) තිබීම 2. ලේඛනයට අරමුණක්, ලේඛන රටාවක් තිබේ.
3. තාක්ෂණය නිසා ලේඛන රටා වෙනස් වීම.
4. නියමිත සම්ප්‍රදායන්, රීති, යෙදුම්, ව්‍යාකරණ, විරාම ලක්ෂණ අත්‍යවශ්‍ය වීම.
5. ලේඛන ආකෘති තිබීම. (විස්තර කර තිබිය යුතුයි.) (ල. 8)

07. (i) 1. කථනය ඵලදායීව යොදා ගැනීම. 2. ශ්‍රවණ නිපුණතාවයන් සංවර්ධනය කර ගැනීම.
3. සාහානුභූතිය ඇතිකර ගැනීම. 4. ආචාරශීලී හැසිරීම් ඇතිකර ගැනීම. (ල. 2)

(ii) සමූහයක් තුළ වෙසෙන්නන්ගේ අදහස් එක සමාන නොවන නිසා යම් යම් කරුණු සම්බන්ධයෙන් පුද්ගලයින්ගේ අදහස් වෙනස් වේ. එකඟවීම හෝ නොවීම ඔවුන්ගේ පිළිගැනීම්, තේරුම් ගැනීම්, අත්දැකීම් හෝ ආත්මාර්ථකාමය හෝ පරාර්ථ යනාදී හේතුමත තීරණය කරයි.
සමූහයට අදහස් දැරීමේ නිදහස තිබෙනවිට ඔවුන් විරුද්ධවීමට ඉඩක් ලබාගනියි. පාලය කරනු ලබන සමාජවල 'එකගවීම' අනිවාර්යයෙන් සිදුකළ යුතුවේ. ප්‍රජාන්තවාදී සමාජවල එකඟවීමට හෝ විරුද්ධ වීමට අයිතියක් තිබේ. (ල. 2)

(iii) 1. සිතිවිලි හා හැඟීම් මත පංචේන්ද්‍රියන් ආශ්‍රයෙන් සන්නිවේදනය සිදුවීම.
2 තම දැක්මට අනුව සංකල්ප ක්‍රියාත්මකවීම. 3. ආත්ම භාෂණයට ප්‍රමුඛත්වය ලැබීම.
4. තමා තුළ ඇති මතකය මත සන්නිවේදනය සිදුවීම. 5. පුද්ගලයා තුළ තීරණ ගැනීමේ කාර්ය සිදුවීම. (ල. 6)

(iv)

| | |
|---|---|
| කියවූ දෙයින් | 10% |
| ඇසූ දෙයින් | 20% |
| දුටු දෙයින් | 30% |
| ඇසූ, දුටු දෙයින් | 50% |
| කියූ ලියූ දෙයින් | 70% |
| තමන් කළකී දෙයින් | 80% |

(ල. 4)

මතක තබා ගැනීමට අසාර්ථකම ක්‍රමය වන්නේ කියවීම පමණක් සිදු කිරීමයි. එයින් මතකයේ රැදෙන්නේ 10% ක් පමණි.....
යනාදී ලෙස විශ්ලේෂණය කර තිබීමට ලකුණු 4 (8)